තොරතුරු මාසිකය

2026 ජූලි - අගෝස්තු
ජනතා විමුක්ති පෙරමුණේ
අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි.

විමර්ශන

ලෝකය වෙනස් කිරීමට වෙනස් වෙමු!

# 2022 ලංකාවේ ආර්ථික අර්බුදය සහ වත්මන් ආර්ථික තත්වය

**ශ්‍රී ලංකාව මෙයට වසර කිහිපයකට පෙර එනම්, 2022 වන විට තිබුණේ ආර්ථික අර්බුදයකය. එහි උච්චතම ප්‍රතිඵලය ලෙස 2022දී ලංකාවට ණය වාරික ගෙවා ගැනීමට නොහැකිවීම මත එම වසරේම අප්‍රේල් 12 වැනි දින ලංකාව බංකොළොත් රටක් ලෙස ජාත්‍යන්තර වශයෙන් ප්‍රසිද්ධ කර තිබිණි.**

සත්‍යය ලෙසම ඒ මොහොතේ ලංකාව මුහුණ දී තිබුණේ ආර්ථික අර්බුදයකටය. අප විසින් එය ධනේශ්වර ක්‍රමයේ අර්බුදය ලෙස විග්‍රහ කර තිබුණේ එනිසාමය. ඉන්පසු ක්‍රමයෙන් අර්බුදය තීව්‍ර වූ අතර, රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවටද එයට පිළිතුරු සොයාගත නොහැකි විය. එය පැවැති අර්බුදයේ දිගුවක් ලෙස ක්‍රියාත්මක විය. එබැවින්, එය බල හුවමාරුවක් දක්වා වර්ධනය වන තරමටම ප්‍රබල විය. ඉන්පසු බලය ලබා ගත් එන්පීපී ආණ්ඩුව වසරක් ඇතුළත ආර්ථික අර්බුදය සමනය කර ගත්තේ කිසිවකු බලාපොරොත්තු නොවූ ආකාරයටය. එහෙත්, විපක්ෂය විටින් විට ලංකාවේ ආර්ථික අර්බුදයක් ඇති බවට මුසා බස් දොඩවයි. ඇත්තටම ලංකාවේ ආර්ථික අර්බුදයක් පවතීද යන්න පිළිබඳව හෝ ඇතිවිය හැකිද යන්න පිළිබඳව හෝ සොයා බැලිය යුතුය.

රටක ආර්ථික අර්බුදයක් පවතීද යන්න හිතළු ලෙස පැවසිය නොහැකිය. ඒ සඳහා ආර්ථික විද්‍යාවේ පිළිගත් නිර්ණායකයන් ඇත. කෙනකු ප්‍රකාශයක් කළ පමණින් ආර්ථික අර්බුද හට ගන්නේ නැත. ආර්ථික අර්බුදයකදී එය ආර්ථිකයේ හැසිරීම මත සහ ජන ජීවිතයට එය බලපාන ආකාරය මත තීරණය වේ. ජනතාවට තවදුරටත් තම පැරැණි ජීවිතය ගෙනයා නොහැකි මට්ටමට පත්විය යුතු අතර එදිනෙදා සාමාන්‍ය ජීවිතයේදී එය දැකගත හැකි විය යුතුය. ආර්ථික අර්බුදයකදී පහත ලක්ෂණ දැකගත හැකිවේ.

## නිෂ්පාදනය කඩාවැටීම

රටක දළ දේශීය නිෂ්පාදනය දිගින් දිගටම කඩාවැටෙන්නේ නම්, එය ආර්ථික අර්බුදයක ලක්ෂණයකි. එහෙත්, ලංකාවේ පවතින්නේ කඩාවැටුණු ආර්ථිකය නැවත පණගසමින් ඉතා වේගයෙන් නැඟීසිටින තත්ත්වයයි. එය ආර්ථිකයේ ප්‍රධාන දත්ත මඟින් පිළිබිඹු වෙමින් පවතී. රටක ආර්ථිකයේ ස්ථාවරභාවය හෝ කඩාවැටීම හෝ දක්වන ප්‍රධාන නිර්ණායකයක් වන දළ දේශීය නිෂ්පාදනයේ සහ ආර්ථික වර්ධන වේගයේ උච්චාවචනයෙන් එය පැහැදිලි වේ.

පහතින් සඳහන් වන්නේ පසුගිය වසර කිහිපයක ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදනයේ හැසිරීමයි (වගු අංක 01).

(වගු අංක 01)

| වසර | 2025 | 2024 | 2023 | 2022 |
|---|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදනය (ඩොලර් බිලියන) | 108.8 | 99.6 | 83.7 | 74.6 |
| ආර්ථික වර්ධන වේගය | 5% | 5 % | -2.2 % | -7.3 % |
| ආසියාවේ ආර්ථික වර්ධන වේගය | 4.50 % | 4.60% | 5% | 3.90% |

මෙම දත්තවලට අනුව 2022 සහ 2023 වර්ෂවල සෘණ ආර්ථික වර්ධනයක් නොහොත් ආර්ථිකයේ පසුබෑමක් පැවැතුණු අතර, 2024 සහ 2025 වර්ෂවල අඛණ්ඩව 5.00%ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගෙන තිබේ. 2025 වර්ෂයේ ආසියාවේ ආර්ථික වර්ධන වේගයේ සාමාන්‍යය 4.5%ක් වෙද්දී අප විසින් එය 5.00%ක මට්ටමේ පවත්වාගෙන යාම ආර්ථික ක්ෂේත්‍රයෙන් අත්පත් කරගත් විශාල ජයග්‍රහණයකි. එය ආසියාවේ සාමාන්‍ය අගයටත් වඩා ඉහළ අගයකි. අනෙක් අතට කොවිඩ් වසංගතයෙන් පසුවද ආසියාවේ සාමාන්‍ය ආර්ථික වර්ධන වේගය 3.00%ක මට්ටමේ පැවැතියද, ලංකාවේ ආර්ථික වර්ධන වේගය පැවැතියේ -7.00 මට්ටමකය. එයින් අදහස් වන්නේ කොවිඩ් වසංගතය නිසා ලෝකයේ ආර්ථික කඩාවැටුණාය යන්න පිළිගත හැකි තර්කයක් නොවන බවයි.

ඒ අතර, 2026 වසරේ මුල් කාර්තුවේ ආර්ථික වර්ධන වේගය 5.1%ක් දක්වා ඉහළට එසැවීමට සමත් වීමෙන් පෙන්නුම් කෙරෙන්නේ අර්බුද හමුවේ වුවද, ලංකාවේ ආර්ථිකය ක්‍රමානුකූලව වර්ධනය වන දිශාවට ගමන් කරන බවයි. එනිසා ආර්ථික අර්බුදයක මූලික ලක්ෂණයක් වන නිෂ්පාදනයේ කඩාවැටීම හිතළුවක්ම පමණකි.

## ණය ගෙවා ගැනීමට නොහැකි වීම

ආර්ථික අර්බුදයක තවත් මූලික ලක්ෂණයක් වන්නේ දේශීය සහ විදේශීය ණය වාරික සහ පොලී ගෙවීමට නොහැකි වීමයි. දේශීය ණය කෙසේ වෙතත්, විදේශීය ණය ගෙවීම මෙහිදී විශේෂ වේ. 2022 වර්ෂයේදී ශ්‍රී ලංකාවට විදේශ ණය ගෙවා දැමීමට නොහැකි වීමෙන් එම වසරේදී බංකොළොත් රටක් බවට පත්විය. එහෙත්, පසුගිය වසර කිහිපය තුළ ලංකා ආණ්ඩුව විදේශ ණය ගෙවීම යහපත් අන්දමින් කළමනාකරණය කළ අතර ජාත්‍යන්තර වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද බංකොළොත්භාවයෙන් නිදහස් විය. ලංකාව පහත සඳහන් පරිදි පසුගිය වර්ෂ කිහිපයෙහි ණය වාරික සහ පොලී ගෙවීම සිදුකර තිබුණි (වගුව 02).

(වගු අංක 02)
ණය වාරික සහ පොලී ගෙවීම්
එ.ජ.ඩො.මිලියන

| වසර | 2025 | 2024 | 2023 |
|---|---|---|---|
| වාරික ගෙවීම් | 3,761 | 3,122 | 1,869 |
| පොලී ගෙවීම් | 1,388 | 1,132 | 720 |
| මුළු ගෙවීම් | 5,149 | 4,524 | 2,589 |

ඒ අනුව ලංකා ආණ්ඩුව දැනටමත් ගෙවිය යුතු ණය වාරික සහ පොලී ගෙවීම නිසි පරිදි කළමනාකරණය කරමින් කටයුතු කරන අතර, ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල පැසසුමට පවා එය ලක්වී ඇත.

# බැටරි බලශක්ති
## ශ්‍රී ලංකාවේ බල
## තීරණාත්මක

**නූතන නවීකාරක සමාජ සංස්ථාව තුළ බලශක්තිය යනු රාජ්‍යයක පැවැත්ම තීරණය කරන ගාමක බලවේගයක්ව තිබේ. නැගී එන ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගනිමින් සිටින රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව මේ වන විට සිටින්නේ සිය බලශක්ති මෙහෙයුමේ සංක්‍රාන්ති සමයක ය. සාමාන්‍යයෙන් ලංකාවේ විදුලිය වැඩි වශයෙන් උත්පාදනය කරන්නේ ජලය සහ ගල්අඟුරු යන බලශක්ති ප්‍රභවයන් මූලික කොටගෙනය. ඒ අනුව දළ වශයෙන් රටේ සමස්ත විදුලිබල අවශ්‍යතාවෙන් 40%කට ආසන්න ප්‍රමාණයක් ජලාශ මඟින් ජනනය කරන අතර, ගල්අඟුරු බලශක්තිය හරහා 35-40%ත් අතර විදුලි අවශ්‍යතාවක් සම්පූර්ණ කෙරේ.**



ගල්අඟුරු හා ඛනිජ තෙල් වැනි පොසිල ඉන්ධන භාවිතය 46.5%ක් තරම් ඉහළ අගයක් ගන්නා අතර, මෙරටට ආනයනය කිරීම පවා විශාල පිරිවැයක් දරමින් සිදුකළ යුතු කටයුත්තකි. විදුලිය ජනනය කිරීමේ දී අධික ඉන්ධන පිරිවැයක් කැප කරන්නට සිදු වීම ජාතික ආර්ථිකයට විශාල අමතර බරක් වන අතරම, 2030 වන විට අප රටක් ලෙස සම්පූර්ණ කළ යුතු පුනර්ජනනීය ඉලක්කවලට බාධාකාරී ලෙස පවතී. මේ තත්ත්වය නිසාම 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ මෙරට බලශක්ති ක්ෂේත්‍රයෙහි කැපීපෙනෙන පරිවර්තනයක් සිදු කිරීමට අරමුණු කරගෙන ඇත.

එනම්,

1. ශ්‍රී ලංකාව කලාපයේ අවම විදුලි මිල සහිත රටක් බවට පත් කිරීම සඳහා තරගකාරී ප්‍රසම්පාදන හා මිල කැඳවීමේ ක්‍රියාවලිය සක්‍රිය කර තෙල් මත පදනම් වූ විදුලිය ජනනය අඩු මිල සූර්ය බලය හා සුළං බලය ප්‍රමුඛ පුනර්ජනනීය ප්‍රභවයන් වෙත යොමු කිරීම.

2. සූර්ය බලය මඟින් මෙගාවොට් 2,000ක් (2,000MW) ක්‍රමිකව ජාතික පද්ධතියට එක් කර ගැනීම.

3. සූර්ය බලයෙන් ජලය පොම්ප කොට ගබඩා කරන බලාගාර සහ බැටරි පද්ධති මෙන්ම දෙමුහුන් පද්ධති පිහිටුවීමට අදාළ ශක්‍යතා අධ්‍යයන කඩිනම් කිරීම. සහ නිසි ආයෝජන කැඳවා ගැනීමට අවශ්‍ය ව්‍යාපාර ආකෘතීන් හඳුන්වා දීම


මේ අනුව 2050 වන විට ශූන්‍ය කාබන් විමෝචනය සහ 2030 වන විට රටේ සමස්ත විදුලි උත්පාදනයෙන් 70%ක් පුනර්ජනනීය බලශක්තියෙන් සපුරා ගැනීම රජයේ ප්‍රධාන ඉලක්කය වී තිබේ. මෙමෙ දැවැන්ත බලශක්ති විප්ලවයේ ප්‍රධානතම මුලපිරීම වන්නේ බැටරි බලශක්ති ගබඩා පද්ධති ස්ථාපනය කිරීමේ රජයේ දිගුකාලීන ඉදිරි පියවරේ සමාරම්භය යි.

BESS යනු, බැටරි බලශක්ති ගබඩා පද්ධති (Battery Energy Storage Systems) යන්නෙහි කෙටි නාමයයි. සරලවම, මින් සිදුවන්නේ මහා පරිමාණයෙන් විදුලිය ගබඩා කර තබාගෙන නැවත අවශ්‍ය වේලාවට එය ජාතික පද්ධතියට මුදාහැරීමයි. මෙහිදී BESS පද්ධති මඟින් සූර්ය බලශක්ති ප්‍රභවයෙන් උපරිම විදුලිය නිපදවන වේලාවන්වල එම අතිරික්ත විදුලිය විශාල බැටරි පද්ධතියේ ගබඩා කර ගනු ලබන අතර, හිරු එළිය නොමැති රාත්‍රී කාලවල සහ රටේ විදුලි ඉල්ලුම අධික වන අවස්ථාවලදී මෙම බැටරිවල පවතින විදුලිය ක්‍රමිකව මුදාහරිනු ලබයි. ජාතික බලශක්තිය අපතේ යාම වළකා අඛණ්ඩව පවත්වා ගැනීමට BESS කාලීනව වැදගත් වූවකි.

| රටේ වත්මන් සමස්ත බලශක්ති උත්පාදනය | |
|---|---|
| **බලශක්ති ප්‍රභවය** | **ප්‍රතිශතය** |
| **ගල්අඟුරු** | **38.3%** |
| **ජල විදුලිය** | **37.2%** |
| **සූර්ය බලශක්තිය** | **10.9%** |
| **ඛනිජ තෙල්** | **8.2%** |
| **සුළං බලශක්තිය** | **4.3%** |
| **ජෛව ස්කන්ධ** | **1.1%** |

- මීට අමතරව සූර්ය බලශක්ති පද්ධතියක් ස්ථාපනය කිරීමෙන් අනතුරුව දැවිතෙල්වලට සහ

# ගබඩා පද්ධතිය
# ශක්ති විප්ලවයේ
# පියවරක්!




ගල්අඟුරුවලට දැරීමට සිදු වන වියදම විශාල ලෙස අඩු කර ගැනීමට හැකියාව ලැබේ.

- වෙළඳපොළේ මිල උච්චාවචනයන් හෝ ඩොලර් අර්බුදයේ බලපෑම මෙරට විදුලි බිල තීරණය කිරීම කෙරෙහි බලනොපානු ඇත.
- මෙමඟින් පද්ධතියේ (Grid) වෝල්ටීයතාව සහ සංඛ්‍යාතය ස්ථාවරව තබා ගැනීමට හැකි වන අතර විදුලි සැපයුමේ හදිසි වෙනස්කම්වලට මිලිතත්පර කිහිපයකින් ප්‍රතිචාර දැක්වීමට හැකි වනු ඇත.
- විදුලිය බිඳවැටීමක් නිසා පද්ධතිය අක්‍රිය වුවහොත්, හදිසි විදුලි සැපයුමක් (Backup Power) ලබා දීමට BESS මඟින් අවස්ථාව සැලැසෙන අතර, රෝහල්, දත්ත මධ්‍යස්ථාන සහ කර්මාන්ත සඳහා මෙය බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.
- මේ වන විට අප විදුලි නිෂ්පාදනයේදී එක් විදුලි ඒකකයක් සඳහා වැඩිම පිරිවැයක් යොදන්නේ ඩීසල් මඟින් විදුලිය නිපදවීමේදී ය. ඩීසල් (සාමාන්‍ය තත්ත්වයන් තුළ) ඒකකයට රුපියල් 115.00ක් පමණ වේ. නමුත්, මෙමඟින් එක් විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීමට වැය වන්නේ රුපියල් 35.00කට ආසන්න පිරිවැයක් පමණි. ඒ අනුව BESS නිසා ඩීසල් මඟින් විදුලිය නිපදවීම අවම කළ හැකි වන අතර, විදුලි පිරිවැය අඩු කිරීමටත්, ඩොලර් සංචිත ඉතිරි කර ගැනීමටත් අවස්ථාව උදා වෙයි.
- ඩීසල් විදුලිය ජනන යන්ත්‍ර භාවිතය අඩු කිරීමට BESS ඔස්සේ මං පෑදෙන අතර ඉන්ධන වියදම මෙන්ම කාබන් විමෝචනය ද අඩු කෙරෙන නිසා පරිසර හිතකාමී විකල්පයක් බවට ද මෙය පත් වනු ඇත.


ඒ අනුව මෙරටට ප්‍රදානය කර ඇති සමස්ත බැටරි පද්ධතිය මෙගාවොට් 160කින් සමන්විත වේ. මේ වන විට වාර තුනකදී මෙගාවොට් 20ක්, මෙගාවොට් 60ක් සහ මෙගාවොට් 70ක් බැගින් වාර තුනකදී බැටරි පද්ධති මෙරටට ගෙනැවිත් තිබේ.

මෙගාවොට් 10ක හා මෙගාවොට් පැය 40ක ධාරිතාවෙන් යුත් බැටරි බලශක්ති ගබඩා පද්ධති (BESS) ව්‍යාපෘති දහසය (16)ක් සංවර්ධනය කිරීමට මෙමඟින් කටයුතු කරනු ඇත. ඒ සඳහා විදුලි උපපොළවල් 16ක් හඳුනාගෙන ඇත්තේ, සූර්ය බලශක්ති නිෂ්පාදනය බහුල ප්‍රදේශ, පද්ධතියේ අවහිරතා පවතින ප්‍රදේශ සහ අනාගතයේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ප්‍රයෝජනයට ගැනීමට අපේක්ෂිත ප්‍රදේශ ආදිය ගැන සැලැකිල්ලට ගනිමිනි. ඒ අනුව කිලිනොච්චිය, වවුනියාව, පොළොන්නරුව, වාලච්චේනයි, අම්පාර, වවුනතිව්, මොනරාගල, මහියංගනය, චුන්නාකම්, බෙලිඅත්ත, ගාල්ල, පුත්තලම, හම්බන්තොට, පැල්ලණ්ණ අනුරාධපුරය, මහව, නොරොච්චෝලයි යන ප්‍රදේශවල පිහිටි විදුලි උපපොළවල් කේන්ද්‍ර කරගෙන මෙම පද්ධති ස්ථාපනය කෙරේ.

තරගකාරී ජාත්‍යන්තර ටෙන්ඩර් පටිපාටිය යටතේ තෝරා ගනු ලැබූ සමාගම් තුනකට මෙම ව්‍යාපෘතිය පිරිනමන ලද අතර, ඉන් එක් සමාගමක් විසින් මෙම බැටරි පද්ධතිය ලංකාවට ගෙන එන ලදී. බලශක්ති අමාත්‍යාංශයට අයත් National Systems Operator සමාගම විසින් මෙම පද්ධති පාලනය සහ කළමනාකරණය සිදු කරනු ලබන අතර, නඩත්තු කටයුතු අදාළ සමාගමට පැවරේ.

මෙම සතිය තුළ තවත් ග්‍රිඩ් උපපොළවල් 19ක් සඳහා මෙගාවොට් 250ක බැටරි ගබඩා පද්ධති සපයා සවි කිරීමට අදාළ ලංසු කැඳවීම ආරම්භ කිරීමට නියමිත ය. මීට අමතරව මේ වන විට ක්‍රියාත්මක වන සූර්ය බලාගාර සඳහා මෙගාවොට් 150ක බැටරි ගබඩා පද්ධති සපයා, සවි කිරීමට අදාළ ලංසු කැඳවීමක් ද මේ මස අග වන විට සිදු කිරීමට ජාතික පද්ධති ක්‍රියාකරු පෞද්ගලික සමාගම කටයුතු කරමින් සිටී.

මේ දිගුකාලීන ඉදිරි දැක්ම ප්‍රකාරව ජාතික ආර්ථිකයට අත්වන කෙටිකාලීන සහ දිගුකාලීන වාසි අසීමිත ය. BESS අපට රටක් වශයෙන් ප්‍රයෝජනවත් වන්නේ බලශක්ති අවශ්‍යතා පරිපූර්ණ කිරීමට පමණක් නොවේ. පොසිල ඉන්ධන පදනම් වූ බලශක්ති අර්බුදය නිසා ඇති වන බලශක්ති අවදානම, මහජන පීඩා, ආර්ථික ගැටලු සහ පරිසර දූෂණය අවම කිරීමට ද මෙමඟින් අවස්ථාව සැලසේ.




# එල් නිනෝ (El Niño)

**ස්පාඤ්ඤ භාෂාවෙන් 'එල් නිනෝ' යන්නෙන් 'කුඩා පිරිමි ළමයා' යන අර්ථය දෙයි. නත්තල් සමයේ දී, විශේෂයෙන් නත්තල් ආගමික උත්සවයන් හි දී ජේසු බිළිඳා හැඳින්වීමට ද ස්පාඤ්ඤ භාෂාවෙන් 'එල් නිනෝ' යන්න භාවිතා කෙරේ. (ජේසු බිළිඳා හැඳින්වීමට 'එල් නිනෝ' යන්නට අමතරව තවත් වචන අයත් වුව ද, නත්තල් උත්සවවල දී එයට විශේෂවූ 'කුඩා පිරිමි ළමයා' ජේසු බිළිඳා බැවින් එම කෙටි නමින් හැඳින්වේ.)**

17 වන සියවසේ දී පමණ මසුන් ඇල්ලීම සඳහා මුහුදු ගිය දකුණු ඇමෙරිකාවේ බටහිර, නිවර්තන කලාපීය වෙරළබඩ ප්‍රදේශවල ධීවරයෝ (විශේෂයෙන් පේරු සහ ඉක්වදෝරයේ ධීවරයෝ) දෙසැම්බර් මාසයෙදී පැසිෆික් මුහුදේ උෂ්ණත්වය ඉහළ යාමක් සිදුවන බව නිරීක්ෂණය කළහ. එම කලාපයේ සාමාන්‍යයෙන් පවතින මසුන් බහුල සීතල දියවැල් වෙනුවට දෙසැම්බර් (නත්තල්) මාසයේ දී උණුසුම් දියවැල් ඇතිවන බව දුටු ඔවුහු මෙම තත්ත්වය නත්තලත්, ජේසු බිළිඳාගේ ඉපදීමත් සම්බන්ධ කරගනිමින් 'එල් නිනෝ' ලෙස නම් කළහ. සෑම වසරක දීම මෙම උෂ්ණත්ව වෙනස කුඩා ප්‍රමාණයන්ගෙන් සිදුවුවත්, වසර කිහිපයකට වරක් එය ඉතා ඉහළ මට්ටමකින් වෙනස් වන බව දුටු ඔවුහු පසුව මෙම විශේෂ අවස්ථා හැඳින්වීමට පමණක් 'එල් නිනෝ' යන්න භාවිතා කළහ. මධ්‍යම සහ නැගෙනහිර පැසිෆික් සාගරයේ සිදුවන මෙම කාලගුණය වෙනස්වීම පිළිබඳව ප්‍රථමයෙන්ම (19වන සියවසේ දී) වාර්තා කරනු ලැබුවේ පේරු රාජ්‍යයෙන් වීම නිසා ඔවුන් විසින් ඒ සඳහා භාවිත කරන ලද නාමය ලොව පුරා ප්‍රචලිත විය. ඒ අනුව අද මෙම කාලගුණික තත්ත්වය හැඳින්වීම සඳහා ලොව පුරා පිළිගත් විද්‍යාත්මක නාමය වන්නේ 'එල් නිනෝ' වේ.

මෙම විශේෂ කාලගුණික තත්ත්වයට 'එල් නිනෝ' යන නම ගොඩනැගුණේ නැගෙනහිර පැසිෆික් සාගරය සහ දෙසැම්බර් මාසය පදනම්ව වුව ද, 'එල් නිනෝ' බලපෑම සිදුවන්නේ එම කලාපයට සහ එම මාසයේ දී පමණක් නොවේ. නැගෙනහිර සහ මධ්‍යම පැසිෆික් සාගරයේ මුහුදු ජලය රත්වීම නිසා මෙම කාලගුණික තත්ත්වය ආරම්භ වීමට හේතුව වුව ද, එමඟින් සිදුකරනු ලබන වායුගෝලීය පීඩනය වෙනස්වීමත් සමඟ සිදුවන සුළං රටාවන්ගේ වෙනස්වීම මඟින් පෘථිවියේ ඉතා ඈතින් පිහිටි කලාප පවා මෙම කාලගුණ වෙනස්වීම සමඟ එකිනෙක සම්බන්ධ කරනු ලබයි. එම නිසා මෙම 'එල් නිනෝ' තත්ත්වය සමස්ත පෘථිවියේම සෑම කලාපයකටම පාහේ බලපානු ලබන සංසිද්ධියකි. එහෙත්, එම බලපෑම හරහා ලොව සෑම කලාපයකම සිදුවන්නේ එකහා සමාන කාලගුණික තත්ත්වයක් නොවේ. කෙසේ නමුත්, සෑම කලාපයකම වසරේ අදාළ කාලසීමාවේ සාමාන්‍යයෙන් පවතින කාලගුණය දක්නට නොලැබී වෙනස් කාලගුණික තත්ත්වයන් නිර්මාණය වීම සිදුවේ.

'එල් නිනෝ' තත්ත්වයන් සාමාන්‍යයෙන් උපරිම වන්නේ නොවැම්බර් සිට පෙබරවාරි දක්වා කාලයේ දීය. එහෙත්, එහි ආරම්භය වසරක අප්‍රේල් - ජුනි මාසවල දී පවා සිදුවිය හැකිය. එසේ ආරම්භ වන 'එල් නිනෝ' තත්ත්වය දෙසැම්බර්, ජනවාරි මාසවල දී උපරිමය දක්වා ළඟාවී ඊළඟ වසරේ මුල් කාලය තුළ ක්‍රමානුකූලව අඩුවී යයි. මේ නිසා සාමාන්‍යයෙන් 'එල් නිනෝ' තත්ත්වයක් මාස 9-12ක පමණ කාලයක් පැවැතිය හැකිය. දැනට වාර්තාවී ඇති දීර්ඝතම 'එල් නිනෝ' තත්ත්වය වාර්තාවී ඇත්තේ, 2014දී ය. 2014 වසරේ ඔක්තෝබර් මාසයෙන් පමණ ආරම්භ වූ මෙම තත්ත්වය 2015 වසර මුළුල්ලේම පැවැතී 2016 වසරේ මැයි - ජුනි පමණ වනවිට අවසන් විය. එය සාමාන්‍යයෙන් මාස 19ක පමණ කාලයකි. එමෙන්ම 1982දී පැමිණි 'එල් නිනෝ' තත්ත්වය මාස 14-15ක් පමණ ද, 1997දී එය මාස 12-13ක් පමණ ද පැවැතී ඇත.








දෙසැම්බර් මාසය ආසන්න කාලසීමාවේ දී සූර්යයා පෘථිවියේ දකුණු අර්ධගෝලයට මුදුන්ව පිහිටන අතර දෙසැම්බර් 21-22 දිනවල මකර නිවර්තනයට සූර්යයා මුදුන් වේ. එම නිසා මෙම කාලයේ දී පැසිෆික් සාගරයේ දකුණු නිවර්තන කලාපයට සහ සමකය ආසන්නයට වැඩිම සූර්ය තාපයක් ලැබෙන කාලය වීම නිසා පැසිෆික් සාගරයේ මතුපිට ජලය වැඩි වශයෙන් උණුසුම් වේ. එමෙන්ම සාමාන්‍යයෙන් පැසිෆික් සාගරයේ නිවර්තන කලාපයේ සුළං නැගෙනහිර සිට බටහිර දෙසට ගමන් කරන බැවින්, නැගෙනහිර ප්‍රදේශයේ පවතින රත්වූ මුහුදු ජලය බටහිර ප්‍රදේශවලට තල්ලු කරනු ලබයි. එහෙත්, ඍතු වෙනස්කම් නිසා දෙසැම්බර්, ජනවාරි කාලවල මෙම සුළං මඳක් දුර්වල වේ. මෙම තත්ත්වය ද නැගෙනහිර සහ මධ්‍යම පැසිෆික් සාගරයේ මතුපිට උෂ්ණත්වය වැඩිවීමට හේතු වේ. 'එල් නිනෝ' තත්ත්වයක දී මෙම සුළං අතිශයින් දුර්වල වන අතර, සමහර අවස්ථාවල රටාව වෙනස්වී බටහිර දෙස සිට නැගෙනහිර දෙසට සුළං හැමීම ද සිදුවේ. මේ නිසා පැසිෆික් සාගරයේ බටහිර එක්රැස්වී ඇති උණුසුම් මුහුදු ජලය පරයා සාගරය අභ්‍යන්තරයෙන් නැගෙනහිර දෙසට ගලායාම ආරම්භ වේ. මේවා කෙල්වින් තරංග ලෙස ද හැඳින්වේ. මෙය මාස කිහිපයක් තිස්සේ සිදුවන අතර, අවසානයේ දකුණු ඇමෙරිකානු කලාපයේ උණුසුම් මුහුදු ජලය එක්වීමත් සිදුවේ. මෙලෙස උණුසුම් මුහුදු ජලය එක්වීමත්, එම ජලය ප්‍රසාරණය වීමත් නිසා එම කාලාපයේ මුහුදු මට්ටම ද සුළු වශයෙන් ඉහළ යයි. එමෙන්ම මෙම හේතු නිසා නැගෙනහිර පැසිෆික් සාගරයේ උණුසුම් ජලයේ පවතින ගැඹුර ඉහළ යයි. සාමාන්‍ය කාලවල දී මෙම තීරය ඉතා පටු නිසා සාගර අභ්‍යන්තරයේ ඇති සිසිල් ජලය පහසුවෙන් ඉහළට පැමිණ උණුසුම අඩු කළ ද, මෙම



තීරය පුළුල්වීමත් සමඟ එම ක්‍රියාවලියද අඩපණ වේ. මේවා එකිනෙක හා සම්බන්ධිත ස්වයංවර්ධන ක්‍රියාවලියකි. වසර කිහිපයකට වරක් මෙම තත්ත්වයන් හොඳින්ම ගැළපී වර්ධනය උපරිම වන කාලවලදී 'එල් නිනෝ' තත්ත්වයන් නිර්මාණය වේ.

මෙය ලෝකයේ එක් එක් කලාප සඳහා බලපානු ලබන්නේ එක් එක් ආකාරයටය. දකුණු ආසියාවේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, පාකිස්ථානය වැනි රටවල නිරිත දිග මෝසම සක්‍රිය වන කාලය 'එල් නිනෝ' ඇතිවන කාලයට අයත් නිසා මෝසම් වර්ෂාපතනයේ අඩුවීමක් සිදුවිය හැකිය.




සාමාන්‍ය උෂ්ණත්වයට වැඩි දැඩි අව්රශ්මියක් සහිත වියළි කාලගුණයක් පැවැතිය හැකිය. එමෙන්ම 'එල් නිනෝ' තත්ත්වයක් තුළ මෙම කලාපයේ අක්‍රමවත්, එමෙන්ම අසාමාන්‍ය වැසි තත්ත්වයන්ද ඇතිවිය හැකිය. සමස්තයක් ලෙස කෘෂිකර්මාන්තය වැනි ක්ෂේත්‍ර සඳහා දැඩි බලපෑමක් ඇති වන ලෙස ජලය හිඟ, නියං තත්ත්වයක් පවතින අතර, අක්‍රමවත් වැසි ඇති වුවද, ඒවා ජලාශ පෝෂණය කළ හැකි මට්ටමේ ඒවා නොවේ.

ඕස්ට්‍රේලියාව සහ අග්නිදිග ආසියාවේ ඉන්දුනීසියාව, මැලේසියාව, පිලිපීනය වැනි රටවල් ආශ්‍රිත අහසේ වලාකුළු නැඟෙනහිරට තල්ලුවී යාම නිසා දැඩි නියං තතත්වයන් ඇතිවේ. එමෙන්ම මෙම රටවල ඇතිවන දීර්ඝකාලීන නියං තත්ත්වයන් හේතුවෙන් විශාල ලැව්ගිනි ඇතිවිය හැකි අතර, ඒවායේ බලපෑම අසල්වැසි රටවලටද දැනිය හැකිය.

දකුණු ඇමෙරිකාවේ බටහිර වෙරළබඩ රටවලට එනම්, ඉක්වදෝරය, පේරු, චිලී, කොළොම්බියාව වැනි රටවලට අධික වර්ෂාව ලැබීම සහ ගංවතුර, නායයාම් තත්ත්වයන් ඇතිවීම සිදුවිය හැකිය. මෙම කලාපය ආශ්‍රිත මුහුදු වතුරේ උෂ්ණත්වය වැඩිවීම නිසා ඒ සමඟම ඉහළ යන වායුගෝලීය උෂ්ණත්වය නිසා ඇතිවන අඩු පීඩනයත් සමඟ පැසිෆික් සාගරයේ බටහිර ඇතිවන වලාකුළු නැඟෙනහිර ප්‍රදේශයට ඒකරාශීවීම නිසා මෙම අධික වැසි තත්ත්වය ඇතිවේ. එමෙන්ම මෙම කලාපයේ මුහුදේ උෂ්ණත්වය ඉහළ යාම නිසා ධීවරයන්ට ලැබෙන මත්ස්‍ය අස්වැන්නේ අඩුවීමක්ද දක්නට ලැබේ. කෙසේ නමුත්, මෙම කාලසීමාවේදී දකුණු ඇමෙරිකාවේ නැඟෙනහිර ප්‍රදේශයට (බ්‍රසීලය ආදී රටවලට මෙන්ම ඇමෙසන් වනාන්තරය ආශ්‍රිත ප්‍රදේශයන්ට) වැසි අඩු, නියං කාලගුණ තත්ත්වයක් ඇතිවේ.

උතුරු ඇමෙරිකානු කලාපය සැලැකූ විට ඇමෙරිකා එක්සත් ජනපදයේ දකුණු ප්‍රදේශවලට විශේෂයෙන් කැලිෆෝනියා, ටෙක්සාස්, ෆ්ලොරිඩා වැනි ප්‍රාන්තවලට ශීත කාලගුණික තත්ත්වය යටතේම වැසි වැඩිවීමක් දක්නට ලැබේ. සමස්ත මෙක්සිකෝවටම වැසි වැඩි කාලගුණික තත්ත්වයක් ඇතිවන අතර, උතුරු මෙක්සිකෝවේ අසාමාන්‍ය ලෙස ශීත තත්ත්වයක් ඇතිවීමත්, වැඩි හිමපතනයක් ඇතිවීමත් දැකිය හැකි වේ. එහෙත්, උතුරු ඇමෙරිකාවේ උතුරු ප්‍රදේශවල (කැනඩාවේ සහ එක්සත් ජනපදයේ උතුරු කොටසේ) ශීත කාලයේ හිමපතනය වෙනදාට වඩා අඩුවේ. එමෙන්ම ශීත කාලගුණික තත්ත්වය යටතේ වුවද, සාමාන්‍ය උෂ්ණත්වයට වඩා මඳ උණුසුමක් දැනිය හැකිය. එමෙන්ම අත්ලාන්තික් සාගරය පදනම් කරගත් 'හරිකේන්' ඇතිවීමේ අවදානම අඩුවීමක්ද 'එල් නිනෝ' පවතින කාලවලදී සිදුවේ.

පැසිෆික් සාගරය පදනම් කරගනිමින් සිදුවන මෙම කාලගුණික වෙනස්වීම් අප්‍රිකානු මහාද්වීපයටද බලපානු ලබන අතර, නැඟෙනහිර අප්‍රිකානු රටවල (කෙන්යාව, ටැන්සානියාව, සෝමාලියාව වැනි) අධික වර්ෂාපතන ඇතිවීම නිරීක්ෂණය කළ හැකිය. මෙම කලාපයේ රටවල වසංගත තත්ත්වයන් පැතිර යාම වැඩිම වශයෙන් වාර්තාවී ඇත්තේද 'එල් නිනෝ' තත්ත්වයන් පවතින කාල වකවානුවලදීය. එහෙත්, දකුණු අප්‍රිකානු රටවල වැසි අඩුවී නියං කාලගුණික තත්ත්වයක් දැකිය හැකිවේ. 'එල් නිනෝ' තත්ත්වයකදී මෙම කලාපයේ රටවල සාමාන්‍යයෙන් සාගත තත්ත්වයන්ද ඇති වේ.

'එල් නිනෝ' තත්ත්වයක් හමුවේ සමස්තයක් වශයෙන් ගෝලීය උණුසුම ඉහළ යාමක් සිදුවේ. එම නිසා සෑම රටකම පාහේ පවතින කාලගුණික තත්ත්වයන්යට සාපේක්ෂව සැලැකූ විට වැඩි උෂ්ණත්වයක් වාර්තා වීම සිදුවේ. එමෙන්ම මුහුදු ජලයේ උෂ්ණත්වය ඉහළ යාම නිසා කොරල්පර ආදිය විනාශ වීමද බොහෝ විට දක්නට ලැබේ.

'එල් නිනෝ' සම්බන්ධයෙන් සාකච්ඡා කරද්දී, 'ලා නිනා' (ස්පාඤ්ඤ භාෂාවෙන් මෙහි අර්ථය 'කුඩා ගැහැනු ළමයා' යන්නය.) සම්බන්ධයෙන්ද අවධානය යොමු කළ යුතුය. 'ලා නිනා' ඇතිවන්නේ නැඟෙනහිර සහ මධ්‍යම පැසිෆික් සාගරයේ ජලය අසාමාන්‍ය ලෙස සිසිල්වීම පදනම් කරගනිමිනි. මෙම කාලගුණික තත්ත්වයේදී පෙර අප විසින් සාකච්ඡා කරන ලද 'එල් නිනෝ' තත්ත්වයක් යටතේ සිදුවන කාලගුණික වෙනස්වීම්වල ප්‍රතිවිරුද්ධ තත්ත්වයන් දැකිය හැකිය. නිදසුනක් ලෙස 'ලා නිනා' තත්ත්වයකදී දකුණු ඇමෙරිකාවේ බටහිර වෙරළේ රටවලට අධික නියං කාලගුණයක් මෙන්ම දකුණු ආසියාවේ සහ අග්නිදිග ආසියාවේ රටවලට අධික වර්ෂාපතනයක් ඇතිවීම් සිදුවේ.

විද්‍යාත්මක ලෝකයේදී 'එල් නිනෝ' සහ 'ලා නිනා' වෙන් වෙන්ව අධ්‍යයනය නොකර ENSO (El Niño – Southern Oscillation) නම් පොදු චක්‍රයක අවස්ථාවන් ලෙස සංයුක්තව අධ්‍යයනය කරනු ලබයි.


වර්තමානයේ ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම නිසා 'එල් නිනෝ' තත්ත්වයන් ඇතිවීමේ අවදානම වර්ධනයවී තිබේ. එමෙන්ම එලෙස ඇතිවන 'එල් නිනෝ' තත්ත්වයන් දිගු කාලයක් මුළුල්ලේ බලපෑම් සිදුකරමින්, වර්ධනය වීමටද මිනිස් ක්‍රියාකාරකම් නිසා පසුගිය කාලයේ සිදුවූ ගෝලීය උෂ්ණත්වය වැඩිවීම හේතුකාරක වී ඇත. වසරින් වසර සිදුවන ගෝලීය උෂ්ණත්වය වැඩිවීම නිසා ඉදිරියේදී ඇතිවන 'එල් නිනෝ' තත්ත්වයන් අදට සාපේක්ෂව වඩා දරුණු ප්‍රතිඵල ගෙන දිය හැකිය.

# මැදපෙරදිග යුද්ධය හේතුවෙන් ලෝකය පුරා සාමාන්‍ය ජනතාව පීඩාවට!

මේ වසරේ පෙබරවාරි මාසයේ දී ඇමෙරිකාව සහ ඉරානය අතර යුද්ධය ආරම්භ වීමෙන් පසුව එහි සෘජු බලපෑම නිසා මේ වන විට ලොවපුරා රටවල කෝටි 3ක පමණ ජනතාවක් අලුතින් දරිද්‍රතා මට්ටමෙන් පහළට ඇදවැටී සිටිති.

එමෙන්ම යුද්ධයෙන් ඇත්ත ජය ලැබූ අනෙක් පිරිස වන්නේ අවි ආයුධ නිෂ්පාදන සමාගම්, එනර්ජි සමාගම් සහ මහා පරිමාණ බැංකුකරුවෝ ය.

පසුගිය වසරේ මුල් මාස 6ට සාපේක්ෂව මේ වසරේ මුල් මාස 6 තුළ ඉන්ධන සඳහා බ්‍රිතාන්‍යයේ එක් පවුලක් වැය කළ මුදල පවුම් 360-400ත් අතර ප්‍රමාණයකින් වැඩි වී ඇත. යුරෝපයේ අනෙක් රටවල සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ තත්ත්වය ද එසේ ම ය.




නමුත් සෑම අර්බුදයකින් මෙන් ම මේ යුද්ධයෙන් ද මහා පරිමාණ සමාගම් ලාභ ගොඩගසා ගනිමින් ඇත. බ්‍රිටිෂ් පෙට්‍රෝලියම් (ඊජ) සමාගමේ ලාභය පසුගිය වසරේ මුල් මාස 6ට සාපේක්ෂව 100% කින් ඉහළ ගොස් ඇත. ඇමෙරිකාවේ බොහෝ තෙල් සමාගම්වල තත්ත්වය ද මීට සමාන ය. බැංකු පොලිය වැඩි කිරීම නිසා යුරෝපයේ ප්‍රධාන බැංකුවල ලාභය 30%කින් පමණ ඉහළ ගොස් ඇත.

# කාලගුණ විපර්යාස නිසා ලෝකයම අර්බුදයක!



ග්‍රීෂ්ම සෘතුව ආරම්භයත් සමග උතුරු ඇමෙරිකාව සහ යුරෝපය තුළ රටවල් විශාල ප්‍රමාණයක් අධික උෂ්ණත්වයෙන් පීඩාවිඳිමින් ඇත.

පසුගිය සති කිහිපය තුළ කැනඩාව, ඇමෙරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍යය, ස්පාඤ්ඤය, ප්‍රංශය වැනි රටවල අක්කර ලක්ෂ ගණනක වනාන්තර ගිනිගෙන විනාශ වී ඇති අතර, ජනතාව ලක්ෂ ගණනක් අවතැන් වී සිටිති.

ප්‍රංශයේ ඓතිහාසික වයින් නිෂ්පාදන ප්‍රදේශයක් වන බෝඩෙක්ස් පළාතේ පමණක් 2,26,000ක් ජනතාව නිවෙස්වලින් ඉවත් කර ඇති අතර, අක්කර දහස් ගණනක වගා සහ දේපොළ විනාශ වී තිබේ.

# ඇමෙරිකාවේ තරුණ තරුණියෝ වමට හැරෙති!

අසාර්ථක මැදපෙරදිග යුද්ධය හමුවේ උග්‍ර වී ඇති ආර්ථික අර්බුදයත් සමග ඇමෙරිකානු තරුණ පරපුර සමාජවාදී අපේක්ෂකයකු කෙරෙහි විශ්වාසය වැඩි කරගෙන සිටින බව සමීක්ෂණ මත පළ කරයි. 'වොෂින්ටන් පෝස්ට්' පුවත් පත විසින් අප්‍රේල් මාසයේ කරන ලද සමීක්ෂණයකින් හෙළි වී ඇත්තේ, ඇමෙරිකානු තරුණ තරුණියන්ගෙන් 40%ක් පමණ සමාජවාදී අපේක්ෂකයකු පිළිබඳ කැමැත්ත ප්‍රකාශ කර ඇති බවයි. එය වයස අවුරුදු 30ට අඩු අයගෙන් 46%ක් පමණ වන අතර, ඩිමොක්‍රටික් පක්ෂයේ තරුණ තරුණියන් අතර 64% ක් තරම් ඉහළ ය. දශක ගණනක් පුරා පාසල් අධ්‍යාපනයේ පටන් සමාජවාදයට විරුද්ධ මත ආයතනීකරණය කර ඇති ඇමෙරිකානු සමාජයේ මෙය විශේෂ තත්ත්වයකි.

## ජාත්‍යන්තර තොරතුරු

GLOBAL NEWS

# ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් වූ එක්සත් රාජධානිය!

එක්සත් රාජධානිය තුළ ආර්ථික අර්බුදය උග්‍ර වෙමින් තිබේ. සමස්ත ණය ඩොලර් ට්‍රිලියන 3ක් වී, එය දළ දේශීය නිෂ්පාදිතයේ (ඨෘජ) ප්‍රතිශතයක් ලෙස 100% කට ආසන්න වී ඇත. යුරෝපයේ අය-වැය හිඟය 5%කට වැඩි රටවල් කීපය අතරට එක්සත් රාජධානිය පැමිණ ඇති අතර, පසුගිය වසර පහ ඇතුළත වැඩිම රැකියා විරහිතභාවය මේ වසරේ වාර්තාවූ අතර නිවසක් නොමැති සංඛ්‍යාව 3,09,000ක් දක්වා ඉහළම අගය වාර්තා විය. 2022න් පසුව ලන්ඩන් නගරයේ රැකියා එකකට වඩා කරන ප්‍රමාණය 50%කින් ඉහළ ගොස් ඇත.

ලෝකය පුරාම සිදු වන ආකාරයට ආර්ථික අර්බුදය දේශපාලන අර්බුදයක් ලෙසින් මතු වෙමින් පවතී. දෙවන ලෝක යුද්ධයෙන් පසු අවුරුදු 70ක් 2016 වන තුරු අගමැතිවරුන් 14ක් සිටි අතර, පසුගිය වසර 10 තුළ පමණක් නායකයෝ 7 දෙනකු මාරු වී ඇත. මීට වසර 2කට පෙර අතිවිශාල ජනවරමකින් නායකත්වයට පත් වූ අගමැති කියර් ස්ටාර්මර් ද මේ වන විට ධුරය අත්හැර ගොස් ඇන්ඩි බර්නම් නව නායකයා ලෙස පත් වී ඇත.

නමුත් ජනතා ගැටලුවලට නිවැරැදි විසඳුම් ලබා දීමට හැකියාව ඇති ප්‍රබල වාමාංශික ව්‍යාපාරයක් ගොඩනැඟී නැති වීම නිසා ජාතිවාදී දක්ෂිණාංශික බලවේග හිස ඔසවමින් පවතී. පසුගිය මැයි මාසයේ තිබූ පළාත්පාලන මැතිවරණයේ දී දක්ෂිණාංශික සංක්‍රමණ විරෝධී 'රිෆෝම් යූ. කේ.' පක්ෂය ආසන 1,454ක් දිනාගත් අතර මීට කලින් ඔවුන් සතු වූයේ ආසන 2ක් පමණි. එමෙන් ම මෑත ඉතිහාසයේ ජාතිවාදී ගැටුම් සහ උද්ඝෝෂණ වැඩි වෙමින් පවතී. ආසන්නතම සිදුවීම උතුරු අයර්ලන්තයේ බෙල්ෆාස්ට් නුවරින් වාර්තා වූ අතර, අන්ත දක්ෂිණාංශික සුදු අන්තවාදීන් ජනතා දේපළවලට සහ පොදු දේපළවලට ගිනි තබමින්, කලහකාරී ලෙස හැසිරුණු ආකාරය දැකගත හැකි විය.

## 2022 ලංකාවේ ආර්ථික අර්බුදය සහ ........

01 - පිටුවෙන්

රටට ඩොලර් සංචිත අහිමිවීම නිසා ඛනිජ තෙල් මිලදී ගැනීමට නොහැකි වූ අතර, එම නිසා වෙළෙඳපොළේ විශාල හිඟයක් ඇති විණි. එයට සාපේක්ෂව විශාල කළුකඩ මිලක්ද නිර්මාණයවූ අතර, පෙට්‍රල් ලීටරයක් රුපියල් 1,500 දක්වා මිලකට අලෙවි විය. එය එසේ සිදුවූයේ බාහිර වෙළෙඳපොලේ කිසිදු අවාසිසහගත තත්ත්වයක් යටතේ නොවේ. එහෙත්, පසුගිය මාස කිහිපයේදී ලෝකය තුළ යුදමය තත්ත්වයක් නිර්මාණය වී තෙල් සහ ගෑස් වෙළෙඳපොළ සම්පූර්ණයෙන්ම බිඳවැටී, ලෝක වෙළෙඳපොළෙහි අසාමාන්‍ය තත්ත්වයක් නිර්මාණය වී පවතින තත්ත්වයකදී වුවද, රට තුළ ඉන්ධන සහ ගෑස් සැපයුම ගැටලුකාරි තත්ත්වයකට පත් නොවී මිලද පාලනය කර ගනිමින්, ආර්ථිකය හැසිරවීමට ආණ්ඩුව සමත් විය. ඒ අනුව අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟ වීම යන කාරණය සම්බන්ධයෙන්ද ආර්ථික අර්බුදයකට අදාළ තත්ත්වයක් රටෙහි නොමැත.

### රැකියා අවස්ථා අහිමි වී යාම

ආර්ථික අර්බුදයක් පවතින අවස්ථාවකදී එරටෙහි නිෂ්පාදනය කඩාවැටෙන අතර, ඒ හේතුවෙන් ව්‍යාපාර වැසී යාමේ තර්ජනයට මුහුණ දේ. නිෂ්පාදනය කඩාවැටීමත්, ආර්ථිකය හැකිළී යාමත් නිසා බොහෝ පිරිසකට රැකියා අවස්ථා අහිමිවී යන අතර, ආර්ථිකයේ සේවා වියුක්ති අනුපාතය තවදුරටත් ඉහළ යයි. එහෙත්, ලංකාවේ එවැනි තත්ත්වයක් අසලකවත් නැත. ලංකාවේ සේවා වියුක්ති අනුපාතය පසුගිය වසරේ ඉතිහාසයේ පෙර නොවූ තරමකට අඩුවී ඇත. මෙය පහත සටහනින් පැහැදිලි කළ හැකිය. (වගුව 03)

(වගු අංක 03)
**රැකියා අවස්ථා අහිමි වී යාම**

| වසර | 2025 | 2024 | 2023 | 2022 | 2021 |
|---|---|---|---|---|---|
| **සේවා වියුක්ති අනුපාතය** | **3.9%** | **4.4%** | **4.7%** | **4.7%** | **5.1%** |

ඒ අනුව ලංකාවේ සේවා වියුක්ති අනුපාතය ආර්ථික අර්බුදයක්ව තිබූ 2021 වසරේ සිට 2025 වසර වන විට 3.1%ක් දක්වා අඩුවී ඇත. මෙය නිෂ්පාදනයේ වර්ධනයට සාපේක්ෂව සිදුවී ඇති බව අනෙකුත් ආර්ථික දත්ත මඟින් තහවුරු වේ. රටක ආර්ථික අර්බුදයකදී ප්‍රධාන ලක්ෂණයක් ලෙස මතුවන ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා අහිමිවීම වෙනුවට ලංකාවේ සිදුවී ඇත්තේ, සේවා වියුක්ති අනුපාතය පහළ යාම හෙවත් රැකියා අවස්ථා වැඩිපුර උත්පාදනය වීමයි. ඒ අනුව ආර්ථික අර්බුදයකට අදාළ තවත් ප්‍රධාන නිර්ණායකයක් පවතින්නේ ආර්ථික වර්ධනයක දිශාවේය.

### අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟ වීම

ආර්ථික අර්බුදයකදී අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල භාණ්ඩ වෙළෙඳ පොළේදී පාලනය කළ නොහැකි ලෙස ඉහළ යන අතර, ඒවායේ දුර්ලභ තත්ත්වයක්ද දක්නට ලැබේ. විශේෂයෙන් ආනයනය කරනු ලබන ඛනිජ තෙල් , ගෑස් වැනි භාණ්ඩ සඳහා මෙම තත්ත්වය උදා වේ. 2022 වසරේදී ලංකාවේ අප දුටුවේ එවැනි තත්ත්වයකි.

### විදේශ සංචිත කඩාවැටීම

ආර්ථික අර්බුදයකදී රට තුළට ගලාගෙන එනු ලබන විදේශ මුදල් ප්‍රමාණය අඩුවී යන අතර, ඒ හේතුව මත විදේශ සංචිත අඩුවී යාමක් සිදුවේ. 2021 වසරේ මෙම විදේශ සංචිත ප්‍රමාණය දරුණු ලෙස කඩාවැටී තිබිණි. එහෙත්, අපගේ රජය බලයට පැමිණි පසු අපනයන ආදායමේ ඇතිවූ වර්ධනය, සංචාරකයන්ගේ පැමිණීම ඉහළ යාම, විදෙස් ශ්‍රමික ප්‍රේෂණ විශාල ලෙස ඉහළ යාම යන සාධක මත විදෙස් සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන හත්දහසේ සීමාව පවා ඉක්මවා ගොස් තිබිණි. ඒ අනුව රට තුළින් ඩොලර් අර්බුදයක් මතු වෙතැයි ඇඟිලි ගනිමින් හුන් අයට එය තවදුරටත් යථාර්ථයක් බවට පත්වූයේ නැත.

මෙයට අමතරව ආර්ථික අර්බුදයකට අදාළ කෙරෙන උද්ධමනය, ආර්ථිකයේ භාණ්ඩ මිල, විනිමය අනුපාත පිරිහීම වැනි කරුණු ගත්තද, ඒවායින්ද ආර්ථික අර්බුදයකට අවශ්‍ය කරන ලකුණු පෙන්නුම් කෙරෙන්නේ නැත. එනිසාම ලංකාවේ ආර්ථික අර්බුදයකට අදාළ කරන ප්‍රධාන කාරණා කිසිවක් ඉටු නොවී, ලංකාවේ ආර්ථික අර්බුදයක් පවතී යැයි විපක්ෂය කරනු ලබන වැරැදි අර්ථකථන දීම් පිළිබඳව අප කල්පනාකාරීව සහ සංඛ්‍යා දත්ත මත පදනම්ව අවබෝධ කරගත යුතුය.

## මාක්ස්වාදී න්‍යාය සහ භාවිතාව .....

08 - පිටුවෙන්

මේ මොහොතේ ලෝක දේශපාලනය සැලැකිල්ලට ගත් විට පෙර මෙන් සමාජවාදී කඳවුරක් හෝ ලෙනින්වාදී ජාත්‍යන්තරයක් හෝ නැත. ඇත්තේ, චීනය ඇතුළු සමාජවාදී රටවල් කිහිපයක් පමණි. ධනවාදයේ අර්බුදයට සාපේක්ෂව ලෝක සමාජවාදී ව්‍යාපාරය තිබෙන්නේ දුර්වල ස්ථානයකය. මෙය විශේෂ තත්ත්වයකි. බල කඳවුරු කිහිපයක් මතුවී තිබුණද, තවදුරටත් එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදී කඳවුර සාපේක්ෂ වශයෙන් ශක්තිමත්ව පවතී.

අනෙක් පසින් කලාපීය වශයෙන් හූ දේශපාලන ප්‍රතිවිරෝධතාද යම් සංකීර්ණකමක් ගනු ලබයි (ඉන්දියාව, චීනය, එක්සත් ජනපදය...) රට අභ්‍යන්තරික වශයෙන් ආර්ථික සංවර්ධනයේ මට්ටමද, දීර්ඝ කාලයක් තිස්සේ පුරුද්දේ බලයෙන් මිදීමට නොහැකි නිලධාරීන් සහ බහුතර ජනතාවගේ මනෝභාවයන් ආදී සියල්ල සැලැකිල්ලට නොගෙන යාන්ත්‍රික ලෙස න්‍යාය ආදේශ කිරීමට නොහැකිය.

විශේෂයෙන් ආර්ථික ක්ෂේත්‍රයේදී උපක්‍රම භාවිත කිරීමට සිදුව ඇත්තේ, ධනේශ්වර ආර්ථික සංවර්ධන මට්ටම පහළ ස්ථානයක පිහිටීම නිසාය. ඇතැම් ක්ෂේත්‍ර තවදුරටත් පෞද්ගලික අංශය තුළ පවත්වාගෙන යාමට සිදුව තිබේ. සමාජවාදී ප්‍රතිපත්ති පිළිගනු ලබන අතරම ඒවා පූර්ණ වශයෙන් ක්‍රියාවට නැඟීමට තත්ත්වයන් මෝරා නොමැති අන්තර්කාලීන අවධියක් තුළ උපක්‍රමික ක්‍රියා අනුගමනය කිරීමට සිදුවීම අතිශය තාර්කිකය. ඒ පිළිබඳව ලෙනින්ගේ අදහස මෙසේය:

**"උපක්‍රම ගැන කියතොත්, යථායෝග්‍ය වන්නාවූ සියලුම සැලැසුම් සහ විධි ප්‍රතිපත්ති වශයෙන් පිළිගැනීමත්, නියමිත දේශපාලන අවස්ථාවකදී දැඩි ලෙස අනුගමනය කරනු ලබන සැලැස්මකින් මඟපෙන්වීම ලබා ගැනීම සඳහාවූ ඉල්ලීමත් යන දෙක එකට පටළවා ගැනීම යනු ව්‍යාධි සුව කිරීම සඳහා වෛද්‍ය විද්‍යාව විසින් විවිධ ප්‍රතිකාර ක්‍රම පිළිගනු ලැබ තිබීමත්, කිසියම් ව්‍යාධියක් සුව කිරීම සඳහා කිසියම් නියමිත ප්‍රතිකාර ක්‍රමයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවත් යන දෙක එකට පටළවා ගැනීම හා සමාන දෙයකි."**

**-ලෙනින්, ලෙනින්, එකතු කළ කෘති, 1 වැනි වෙළුම, 162 වැනි පිටුව.**

ධනපති පන්තියේ කුමන්ත්‍රණ මෙන්ම දේශප්‍රේමයේ සහ ජාතිකවාදී සළුපිළි පොරොවා ගත් ජාතිවාදීන්ගෙන්ද, වම ලෙස වෙස්වලා ගත් අතිවාම අවස්ථාවාදීන්ගේද ප්‍රතිවිප්ලවීය කුමන්ත්‍රණ පරදා ලංකාව තුළ සමාජවාදය ගොඩනැඟීමේ කාර්යය සාර්ථක කිරීම සඳහා මාක්ස්-ලෙනින්වාදයත්, එහි ප්‍රායෝගික භාවිතයත් ගැඹුරින් අධ්‍යයනය කළ යුතුව තිබේ.

# මාක්ස්වාදී න්‍යාය සහ භාවිතාව

විශේෂයෙන් වාමාංශික දේශපාලන ක්ෂේත්‍රයේදී කෙරෙන භාවිතාවන් සිදු කරනු ලබන්නේ න්‍යායක් (මඟපෙන්වීමක්) පදනම් කරගෙන බව අපි දනිමු. භාවිතාව නිවැරැදි වන්නේද ඒ සඳහා නිවැරැදි මඟපෙන්වීමක් සිදුවුවහොත් පමණි. **"විප්ලවීය න්‍යායක් නොමැතිව විප්ලවීය ව්‍යාපාරයක් තිබිය නොහැකිය"** යනුවෙන් ලෙනින් අවධාරණය කර ඇත්තේද ඉහත අවශ්‍යතාවයි. වාමාංශික දේශපාලන භාවිතාව සඳහා නිර්ධන පන්තියේ ආධ්‍යාත්මික අවිය ලෙස මාක්ස්වාදය ගොඩනැගෙන්නේද එකවර, හුදෙකලාව හෝ අහඹු දෙයක් ලෙස හෝ නොවේ. ඓතිහාසික සහ විෂයමූල තත්ත්වයන් මත මාක්ස්වාදී න්‍යාය ගොඩනැගුණු අතර, එය විෂයමූල තත්ත්වයන් මත සංවර්ධනයද විය. එමෙන්ම එය ඇදහිල්ලක්ද නොවිය. **"මාක්ස්වාදය ධර්ම පාඨයක් නොවේ. එය ක්‍රියාවට මඟපෙන්වීමකි"** යනුවෙන් එංගල්ස් පැවසුවේද එයයි.

## මාක්ස්වාදී න්‍යායේ උපත, ඓතිහාසික පසුබිම සහ භාවිතය

15, 16, 17 සියවස්වල පැනනැගුණු ධනේශ්වර විප්ලවත් සමග නිර්ධන පන්තියද පුළුල් ලෙස වර්ධනය වන්නට විය. ඒ සමගම ශ්‍රම සූරාකෑමට ලක් වන පන්තිය ලෙස ධනේශ්වර ක්‍රමයට එරෙහි ක්‍රියාකාරීත්වයෙන් ප්‍රතිචාර දැක්වීමද ආරම්භ විය. ආරම්භක වකවානුවේ යන්ත්‍රසූත්‍ර කඩාබිඳ දැමීම ආදී ප්‍රචණ්ඩ ක්‍රියාවලින් මෙම අරගල සමන්විත විය. 'සාගිනි කැරැලි', 'ලුඩ්ඩ් ව්‍යාපාර' ආදිය මේ සඳහා නිදසුන් වෙයි. නිර්ධනීහු පන්තියක් ලෙස නැගී ඒමට පෙර සිටම සාධාරණ සමාජයක් ගැන සිහින මැවූහ. යුරෝපයේ දාර්ශනිකයන් සහ ප්‍රගතිශීලී බුද්ධිමතුන් වෙතින් මේ පිළිබඳ අදහස් ඉදිරිපත් කෙරුණු අතර, රොබට් ඕවන්, තෝමස් මෝ(ර්), තෝමස් කම්පනෙල්ලා, සැන් සිමෝන්, චාල්ස් ෆූරියේ ආදීහු මනෝරාජික සමාජවාදීන් වූහ. මෙම මනෝරාජික සමාජවාදී අදහස්වල සහ ප්‍රංශයේ පන්ති සටන්වල මෙන්ම ජර්මන් දර්ශනවාදය තුළද තිබූ අඩුපාඩු විසින් ඇති කරනු ලැබූ හිඩැස නිවැරැදි දේශපාලන දර්ශනයක් සඳහා පසුබිම සකස් විණි. මාක්ස්වාදය බිහි වන්නේ මෙම පසුබිම තුළය.

යුරෝපයේ නගර කිහිපයක ශාඛා සහිතව ක්‍රියාත්මකවූ 'යුක්තිකාමීන්ගේ සංගමය' ප්‍රතිසංවිධානය කිරීමෙන් 'කොමියුනිස්ට් සංගමය' ගොඩනගනු ලැබීය. මෙම සංවිධානයට නිවැරැදි න්‍යායික මඟපෙන්වීමක් ලබා දීම සඳහා මාක්ස් සහ එංගල්ස් මැදිහත් වූහ. මුල් පියවර වශයෙන් සංගමයේ නම කොමියුනිස්ට් සංගමය වශයෙන්ද, ආදර්ශ පාඨය "ලෝකයේ සියලු මිනිසුන් සහෝදරයෝ වෙති" යන්න වෙනුවට **"සකල දේශවාසී නිර්ධනයිනි සමඟිවව්"** යනුවෙන් වෙනස් කරනු ලැබිණි. කොමියුනිස්ට්වාදයේ මූලික න්‍යායික ලියවිල්ල ලෙස 1848 වර්ෂයේදී මාක්ස් සහ එංගල්ස් විසින් **'කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රකාශනය'** ලියා පළ කරනු ලැබීය.

- පසුව 1864 වර්ෂයේදී ජාත්‍යන්තර වැඩ කරන ජනතාවගේ සංගමය 'පළමුවැනි ජාත්‍යන්තරය' ගොඩනගනු ලැබීය.
- 1889දී දෙවැනි ජාත්‍යන්තරය පිහිටුවීම සහ අවස්ථාවාදයට එරෙහි අරගලය.
- 'ප්‍රාග්ධනය' කෘතිය ලියමින්, මාක්ස් ධනවාදයේ සූරාකෑමේ යාන්ත්‍රණය අනාවරණය කිරීම.

මාක්ස්වාදී න්‍යාය ගොඩනැගීම හා ඉහත සඳහන් ජාත්‍යන්තර සංවිධාන ආරම්භ කිරීම ප්‍රධාන සන්ධිස්ථාන වන අතර මෙම වකවානුව ධනවාදයේ 'නිදහස් තරගය' පැවැති අවධියයි.

**ඊළඟ විශේෂ සන්ධිස්ථානය වූයේ අධිරාජ්‍යවාදී අවධියට ගැළපෙන ලෙස ලෙනින් විසින් මාක්ස්වාදය සංවර්ධනය කිරීමයි.**

- රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය ගොඩනැගීම.
- 1905දී 'සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ උපක්‍රම දෙක' වැඩපිළිවෙළ ඉදිරිපත් කරමින්, සමාජවාදී විප්ලවයට මඟපෙන්වීම.
- 1917 පෙබරවාරිවලදී රුසියානු ධනපති විප්ලවය ජය ගැනීමෙන් පසු 'අප්‍රේල් තිසීසය' ඉදිරිපත් කරමින්, පැරැණි වැඩපිළිවෙළ ඉවත දමා නව වැඩපිළිවෙළකට පක්ෂයට මඟපෙන්වීම (පක්ෂයේ නම රුසියානු කොමියුනිස්ට් පක්ෂය' ලෙස වෙනස් කිරීම).
- 1917 ඔක්තෝබර් විප්ලවයෙන් පසු 1919දී තුන්වැනි ජාත්‍යන්තරය ගොඩනැගීම සහ 'ජාතික විමුක්ති අරගල උපායමාර්ගය' තීරණය කිරීම.
- රුසියානු ආර්ථිකය ගොඩනැගීම සඳහා නව ආර්ථික ප්‍රතිපත්ති (N.E.P.) ඉදිරිපත් කිරීම.

ආදිය මඟින් මාක්ස්වාදයේ බිහිවීම, විකාශනය, සංවර්ධනය සහ භාවිතයට ගැනීම පිළිබඳ දළ අදහසක් අපට ලැබේ.

## න්‍යාය, භාවිතාව සහ අපේ අභියෝග

මේ මොහොතේ අප මුහුණ දෙන විශේෂ තත්ත්වය වන්නේ ආණ්ඩු බලය ලබාගෙන ඇති තත්ත්වයක් තුළ මාක්ස්-ලෙනින්වාදී ව්‍යාපාරයක් ලෙස න්‍යාය භාවිතයට නැඟීමේ අභ්‍යාසයයි. රාජ්‍ය බලය තහවුරු කරගනිමින්, සමාජවාදය ගොඩනැගීමේ අභියෝගය අප හමුවේ තිබේ. කිසිදු ප්‍රායෝගික යථාර්ථයකට මුහුණ නොදෙන ඇතැම් පිරිස් 'වම' ලෙස සලකන්නේ වාමාංශික සටන් පාඨ හඬ නැඟීමයි. සැබෑ දේ නම්, වම යනු සටන් පාඨ හඬ නැඟීම නොව මාක්ස්වාදී න්‍යාය ප්‍රායෝගික තත්ත්වයන්ට ගළපා එහි හරයට හානි නොවනසේ භාවිතයට නැඟීමයි. එහිදී තත්ත්වයන්ට යටත්ව විවිධ උපක්‍රමික පියවර අනුගමනය කිරීමට සිදුවේ. ප්‍රායෝගික තත්ත්වයන් නොසලකමින්, යාන්ත්‍රික ලෙස සටන් පාඨ දෙඩවීම පිළිබඳ ලෙනින්ද අදහස් දක්වා තිබේ.

**"කුෂ්ඨය වේදනාසහගත රෝගයකි. විප්ලවවාදී වාග් පාඨ දෙඩවීම නමැති කුෂ්ඨ රෝගයට මිනිසුන් ගොදුරුවූ විට එම රෝගය දෙස බැලීමෙන් පවා ඉවසිය නොහැකි වේදනාවක් හට ගනී."**

-ලෙනින්, එකතු කළ කෘති, 27 වැනි වෙළුම, 42 වැනි පිටුව.





**"නිවැරැදි විප්ලවවාදී න්‍යායක් තිබීම එම කොන්දේසි නිර්මාණයවීමට පහසුවක් වන නමුත්, න්‍යාය ඇදහිල්ලක් නොවන්නේය. න්‍යාය එහි අවසාන හැඩරුව ලබන්නේ සැබැවින්ම පොදුජන හා සැබැවින්ම විප්ලවවාදී ව්‍යාපාරයක ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය හා සමඟ සම්බන්ධයක් ඇතිව පමණකි."**

-ලෙනින්, එකතු කළ කෘති, 10 වැනි වෙළුම, 135 වැනි පිටුව.